| | |
|---|---|
| **පාඨමාලාව** | PALI 1110.03 ï **පාලි භාෂා අධ්‍යයන ප්‍රවේශය** |
| **දේශක** | මැදගම්පිටියේ විජිතධම්ම හිමි |
| **දේශනය** | අංක 03 |
| **මාතෘකාව** | පාලි භාෂාවේ ජන්මභූමිය |
| **අරමුණ** | පාලි භාෂාවේ ජන්මභූමිය කුමක්දැයි පරීක්‍ෂාකිරීම |
| **අපේක්‍ෂිත ඉගෙනුම් ඵලය** | මෙම දේශනය අවසානයේ දී පාලි භාෂාවේ ජන්මභූමිය පිළිබඳ සාම්ප්‍රදායික හා විචාරාත්මක මතවාද ගෙනහැරපෑමේ හැකියාව ඔබට ලැබෙනු ඇත. |

## පාලි භාෂාවේ ජන්ම භූමිය

වර්තමානයේ දී පාලි නමින් හඳුන්වන්නේ ථෙරවාදී ත්‍රිපිටකයේ හා එහි සම්පූර්ණ උපජීවී සාහිත්‍යයේ භාෂාවයි. වාග්වේදීන්ට අනුව එම පාලි භාෂාව ඉන්දු ආර්ය යුගයේ පූර්ව අවධියට අයත් ප්‍රාකෘත විශේෂයකි. මෙම පූර්ව අවධිය ක්‍රි:පූ: 5 සියවසයේ සිට ක්‍රි:ව: 1 සියවස පමණ කාල පරිච්ඡේදයට සීමා වෙතැයි ලිඛිත සාධක අනුව නිගමනය කළ හැකි වුව ද මෙම යුගයේ මුල් කාලසීමාව කෙතෙක් පැරණි දැයි නිශ්චිතව තීරණය කළ නොහැකිය.

පාලි භාෂාව ප්‍රාකෘත විශේෂයකි. ප්‍රාකෘත යනු එකල උත්තර භාරතයේ ස්වභාවයෙන්ම ඒ ඒ ප්‍රදේශවල පැවති පොදු ජන ව්‍යවහාරයයි. වෛදික භාෂාවේ පාරිශුද්ධත්වය රැක ගැනීමට පාණිනී ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් සකස් වූ බස යන අර්ථ ඇති සංස්කෘතය එකල බ්‍රාහ්මණයන්ගේ හා පාලකයන්ගේ ද භාෂා මාධ්‍ය වූ අතර ප්‍රාකෘත ව්‍යවහාරය පොදු ජනතාවගේ හා ශ්‍රමණ සම්ප්‍රදාය ගරු කළ චින්තකයන්ගේ ද භාෂා මාධ්‍යය විය. මෙම ප්‍රාකෘත ව්‍යවහාරයේ ලිඛිත සාධක අනුව මූල අවස්ථාව නියෝජන කරන පාලි භාෂාව උත්තර භාරතයේම කිසියම් ප්‍රදේශයක කථා ව්‍යවහාරයේ මාධ්‍යයක් වීදැයි විමසා බැලීම වටී. මේ පිළිබඳව මෙතෙක් පළ වී ඇති විවිධ විචාරක මත ඉතා සංක්ෂේපයෙන් මෙසේ දැක්විය හැකිය.

1. ත්‍රිපිටක පාලි භාෂාව ක්‍රි:පූ: 6 වැනි 7 වැනි සියවස්වල කොසොල් රට පැවති කථා ව්‍යවහාරය පදනම් කරගෙන ඇති වූවකැයි ද එදා එය නොයෙක් ජනපදවල ජනතාවගේ පොදු භාෂා මාධ්‍යයැයිද රීස් ඩේවිඩ්ස් පවසයි. ඊට හේතුව බුදුරදුන් කෝසල වාසියෙක් වීමයි. එමෙන්ම පරිනිවාර්ණයෙන් වර්ෂ සීයක් අතර කෝසලයේ දීම ධර්මය සංග්‍රහ කිරිමයි.
2. පාලිය උජ්ජයිනි ප්‍රදේශයේ භාෂාවයැයි වෙස්ටර් ගාඩ්, ඊ. කුන් ආදීහු කියති. ඊට හේතුව අශෝකගේ ගිර්නාර් ලිපිය හා පාලිය සමාන වීමයි. එමෙන්ම මිහිඳු හිමියන්ගේ මාතෘ භාෂාව මෙය වීම හා උන්වහන්සේ විසින් මෙම බසින් තිබූ ත්‍රිපිටකය ලක්දිවට ගෙනවුත් ප්‍රචාරය කිරීම තවත් හේතුවකි.
3. ඔටෝ ෆ්‍රැන්ක් පවසන පරිදි පාලියේ මාතෘ භූමිය වින්ධ්‍යා කඳුවැටි කොටසේ මධ්‍ය හා බටහිර ප්‍රදේශයයි. ගිර්නාර් ශිලා ලේඛනයන් සමග පාලියේ දැඩි සම්බන්ධයක් ඇති බව ඔහුගේ අදහසයි.

4. ස්ටේන් කොනෝව්ගේ තීරණය ද පාලියේ මුල් බිම වින්ධ්‍යා ප්‍රදේශය බවයි. ඊට හේතු වශයෙන් ඔහු දක්වා ඇත්තේ වින්ධ්‍යා ප්‍රදේශයේ උජ්ජයිනිය අවට කථා ව්‍යවහාරයේ පැවති පෛශාචි ප්‍රාකෘතය හා පාලියේ ඇති සමීප තත්ත්වයි.

5. ඔල්ඩන් බර්ග්ගේ මතය අනුව පාලිය කාලිංගයේ භාෂාවයි. ඔහු ඒ සඳහා ඉදිරිපත් කරන හේතු දෙකකි. ඉන් පළමු වැන්න ලංකාවේ අසල්වාසී රටක් වීම නිසා කාලිංගයෙන්ම ලංකාවේ ආගමික ප්‍රචාරක කටයුතු ශතවර්ෂ ගණනාවක් සිදුවෙමින් පැවතීමයි. දෙවැන්න ඛණ්ඩගිරි (ඛාරවේල) ශිලා ලිපියේ භාෂාව හා පාලිය වඩාත් සමීප වීමයි.

6. ඊ. මුලර්ගේගේ අදහස ද කාලිංගල ප්‍රදේශය පාලියේ ජන්මභූමිය වේ යනුයි.

7. මැක්ස් වෝල්සර්ට අනුව පාලිය මගධයේ අගනුවර වූ පාටලි පුත්‍ර නගරයේ භාවිත වූ භාෂාවයි.

8. ආර්. සී. චයිල්ඩර්ස් ප්‍රකාශ කරන පරිදි පාලිය දකුණු බිහාරයේ පැරණි ව්‍යවහාර භාෂාවකි.

9. පාලි භාෂාව යනු කෝසලයේ ව්‍යවහාර වූ භාෂාව යැයි බෙරිඩෙල් කීත් ප්‍රකාශ කරයි. බුදුරදුන්ගේ මව් බස වූයේ කෝසලයේ භාෂාව බව පෙන්වන ඔහු රීස් ඩේවිඩ්ස්ගේ මතයම අනුමත කරයි.

10. බුදුරජාණන් වහන්සේ කෝසලයේ භාෂාවෙන් මුලදී දහම් දෙසන්නට ඇතැයි සිතන වින්ටර්නිට්ස් ප්‍රකාශ කරනුයේ පසුව උන්වහන්සේ මගධ භාෂාව භාවිතා කරන්නට ඇති බවයි.

11. ධ්වනි විචාරය හා පදරූප විද්‍යාව අනුව පාලි භාෂාව ශෞරසේනී බසට බොහෝ සමාන බව බව සුනිති කුමාර් චැටර්ජි ප්‍රකාශ කරයි.

12. පාලි භාෂාව පැරණි අර්ධ මාගධියෙන් සකස් කර ගත්තකැයි සනාථ කිරීමට ලූඩර්ස් පෙළඹී තිබේ.

13. විල්හෙල්ම් ගෛගර් මහතාගේ අදහස පාලිය මගධයේ භාෂාව බවයි. සිල්වන් ලෙවි, ජේම්ස් අල්විස්, වින්ඩිෂ්, ගියර්සන් වැනි උගතුන්ගේ මතය ද එයමය.

14. පාලියේ ජන්ම භූමිය පිළිබඳව අදහස් දැක් වූ ශ්‍රී ලාංකේය උගතෙකු වූ වල්පොල රාහුල තෙරණුවෝ පාලිය ලංකාවේ දී ප්‍රභවයට පත් වූ බසක් බවට කරුණු හෙළි කළහ.